***පකිස්තානයේ සිට ශ්‍රී ලංකාවට වැඩම කළ සර්වඥ ධාතූන් වහන්සේලා, ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය අවසන් කොට නැවත එරටට භාරදීම නිමිත්තෙන් 2016.06.26 දින අරලියගහ මන්දිරයේදී පැවැති පුණ්‍යෝත්සවයේදී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා කළ කතාව.***

තක්ෂිලා ධාතූන් වහන්සේලා වැඳ පුදාගන්නට අපගේ පින්වතුන්ට මාසයක කාලයක් තිස්සේ අවස්ථාව ලැබුණා. දැන් එම අවස්ථාව අවසන් වී එම ධාතූන් වහන්සේලා නැවත පකිස්ථානයට වැඩමවා ගෙන යන අවස්ථාව එළඹිලා තිබෙනවා.

බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව එතැනට පැමිණි කුමාරවරුන් හා රජදරුවන් එම ධාතූන් වහන්සේලා තමන්ගේ ප්‍රදේශවලට ගෙන ගොස් ස්තූප හදා ඒවායේ තැන්පත් කළා. අශෝක අධිරාජයා මෙම ස්තූප හඳුනාගනිමින්, ඒ වකවානුව වන විට ධාතූන් වහන්සේලාට විශාල ඉල්ලුමක් තිබූ බැවින් ධාතූන් වහන්සේලා ස්තූපවලින් ඉවතට ගෙන එක කොටසක් ඒවායේ තැන්පත් කොට ඉතිරි ධාතූන් වහන්සේලා කුඩා කොටස්වලට සකස් කොට, ඉන්දියාව වටා නැවත ස්තූප වල තැන්පත් කරවන්නට කටයුතු කළා.

මෙයින් දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩම කළා. අනුරාධපුරයත්, පොළොන්නරුවත් රජරට ශිෂ්ඨාචාරය කඩාවැටීමෙන් පසුව වයඹ දඹදෙනිය, යාපහුව, කෝට්ටේ හා සීතාවකින් පසුව අද මහනුවරදී අපට දන්ත ධාතූන් වහන්සේ වැඳ පුදා ගන්න අවකාශ ලැබී තිබෙනවා.

අනිකුත් ධාතූන් වහන්සේලා ගැන විශේෂයෙන්ම ප්‍රශ්න තිබුණා. ඉන්දියාවේ ධාතූන් වහන්සේලා හඳුනාගැනීමට අවස්ථාව සැලසුණේ ඉන්දියාවේ ප්‍රින්සෙප් මැතිතුමා හට ටර්නර්ගේ මහාවංශ පරිවර්තනය නිසායි. ටර්නර් මහතා අශෝක සෙල්ලිපි පරිවර්තනය කළා.

පසුව ඉන්දියාවේ බ්‍රිතාන්‍ය අධිරාජය යටතේ විශේෂයෙන්ම එරට පුරාවිද්‍යා සේවාව ආරම්භ වුණා. අපේ වස්කඩුවේ පන්සලේ සුභූති ස්වාමීන් වහන්සේත්, කලිගම් අධ්‍යක්‍ෂකතුමත් අතර එකල ලිපි හුවමාරුවක් සිදු වුණා.

ඒ ලිපිවලට අනුව තක්ෂිලා ප්‍රදේශයේ බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා හඳුනාගන්නට පුළුවන්වීම පිළිබඳව ජෝන් මාර්ෂල් මැතිතුමාට ස්තුතිවන්ත විය යුතුයි. ඒ සෙල්ලිපි හා පර්යේෂණවලට අනුව බුදුන් වහන්ස්ගේ ජීවන කාලසීමාවන් කපිලවස්තු පුරත්, ලුම්බිණියේත් තිබෙන මායාවතී විහාරයේ සෙල්ලිපිවලටත් අනුව මහාවංශයේත් සඳහන් කාල වකවානුවත් සත්‍ය බවට ඔප්පු වී තිබෙනවා.

මෙම ධාතූන් වහන්සේලා අපට ලබාදීම සම්බන්ධයෙන් පළමුවෙන්ම පකිස්තානයේ අගමැති නවාස් ෂෙරිෆ් මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා ලංකාවට පැමිණි අවස්ථාවේදී අප විසින් කළ ඉල්ලීමට අනුව එතුමා මෙම ධාතූන් වහන්සේලා වන්දනා මාන කිරීම සඳහා අපට ලබා දුන්නා. එම නිසා නවාස් ෂෙරිෆ් අගමැතිතුමා ඇතුළු පකිස්තාන රජයට අපගේ ස්තූතිය පුදකරන බව මා සඳහන් කරන්නට කැමැතියි. ධාතූන් වහන්සේලා ලංකාවෙ වැඩම කළ අවස්ථාවේදී පකිස්තාන

මහ කොමසාරිස් තුමා ඇතුළු එහි නිලධාරීන් බෞද්ධ බැතිමතුන් වගේම මෙම ධාතූන් වහන්සේලා ආරක්ෂා කරන්නට විශාල උනන්දුවක් ගත්තා. මේ සම්බන්ධයෙන් තවදුරටත් උනන්දුවී කටයුතු කළ කතානායක කරු ජයසූරිය මහතාත්, විජයදාස රාජපක්ෂ ඇමැතිතුමාත්, රංජිත් මද්දුමබණ්ඩාර ඇමැතිතුමා ඇතුළු සියලු දෙනාටමත්, විශේෂයෙන්ම ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුටත් මා මෙහිදී ස්තූතිවන්ත වෙනවා.

ඉන්දියාවේ එදා පැවැති පුරාවිද්‍යා සේවය අනුව මෙම ධාතූන් වහන්සේලා තැන්පත් කර තිබුණේ අලංකාරව කැටයම් කළ කුඩා පෙට්ටි වලයි. පකිස්තානය අනුගමනය කළේ ද එම පිළිවෙතයි. මම ඉන්දියාවේ කල්කටාවේ මෙම තත්ත්වය දැක තිබෙනවා. නමුත් අද අපේ සම්ප්‍රදායේ හැටියට මෙම ධාතූන් වහන්සේලා තැන්පත් කරන්නට අලංකාර කරඬුවක් දළදා මාළිගාවේ දියවඩන නිලමේ තුමා විසින් ලබාදී තිබෙනවා. ඒ පිළිබඳව මා එතුමාට ස්තූතිවන්ත වන අතර, මෙම ධාතූන් වහන්සේලා නැවත පකිස්තානයට වැඩම කරවන්නේ අපේ එම සම්ප්‍රදායික කරඬුවත් සමග බව මා සඳහන් කරන්නට කැමැතියි. එසේම මෙම ධාතූන් වහන්සේලා සමග පකිස්තානයට වැඩම කරන, කැළණිය රජමහා විහාරාධිපති කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමියන්ටත්, සංස්කෘතික ඇමැති නාවින්න ඇමැතිතුමාටත් අප සුභ පතනවා.

නිදහසින් පසු එදා සිට මේ දක්වා පකිස්තානයත් ශ්‍රී ලංකාවත් අතර දැඩි මිත්‍ර සබඳතාවක් තිබුණා. එම සබඳතාවය කිසිවිටක බිඳුනේ නැහැ. මෙම ධාතූන් වහන්සේලා වැඩම වීමෙන් ලත් පුණ්‍ය කර්මයෙන් අපේ දෙරටවල් අතර ඇති සම්බන්ධතාවය තවදුරටත් ශක්තිමත් වේවා, තහවුරු වේවා, කියා ප්‍රාර්ථනා කරමින් මේ පුණ්‍ය කර්මයේදී සහය දුන්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව අරලිගහ මන්දිරයේ කාර්ය මණ්ඩලය, පොලිසිය, විහාර ස්ථානවල මහා සංඝරත්නය හා බැතිමතුන් සැමට මාගේ ස්තූතිය පුද කරනවා.